ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No . | දිනය / திகதி / Date. 2023/06/08

පැමිණිලි පාර්ශවය : ඩබ්.ඒ.එස්.ඩබ්.යූ.එස්.එස්. සොයිසා මයා ඇතුළු පිරිස,
187/6, අයිතලියද්ද පාර,
දෙවනි කණුව,
මාතලේ.

වගඋත්තරකාර පාර්ශවය : උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය,
ලයනල් ජයතිලක මාවත,
කනදුල්ල,
කුලියාපිටිය.

<u>පැමිණිලි අංකය : HRC/2041/21</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකරු විසින් 2021-09-22 දිනැතිව මෙම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ශිෂ්‍ය විරෝධතාවයකට සහභාගී වූ බව කියමින් ඔවුන්ට එරෙහිව චෝදනාවක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව එහි ප්‍රතිඵලයක් ලෙස වයඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැමිණිලිකරුවන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇති බවත්, ඔවුන්ගේ ශිෂ්‍යභාවය අවුරුදු 04කට අත්හිටුවීමකට තීරණය කර ඇති බවත්ය. තවද, මෙම විරෝධතාවය පැවැත්වීමට හේතු වුයේ 2018 මැයි 24 දින හෝ ඊට ආසන්න දිනයකදී විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළදී විශ්ව විද්‍යාල උප ප්‍රොක්ටර්වරයෙකුට (Sub – Proctor) එරෙහිව විනය පරීක්ෂණක් ඉල්ලා ශිෂ්‍ය අමනාපය ප්‍රදර්ශනය කරමින් හැසිරීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස බව පැමිණිල්ලෙන් දක්වා ඇති අතර, එහිදී පැමිණිලිකරුවන්ට විරුද්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා අවුරුදු 04ක ශිෂ්‍යභාවය අත්හිටුවීමකට තීරණය කර ඇති බවත් දක්වා ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මූලික පරීක්ෂණයෙන් පසු පහත සඳහන් පැමිණිලිකරුවන් 13දෙනෙකුට විරුද්ධව චෝදනා 08ක් සහිතව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර, පැමිණිලිකරුවන් එම සියලු චෝදනා ප්‍රතික්ෂේප කරන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

01. ජේ.ඩී.එස්.ඩබ්.යූ.එස්.එස් සොයිසා (164426)
02. පී.ජ්.එස්.එස් පෙරේරා (164318)
03. බී.එම්.එල්.අයි බස්නායක (1604042)
04. බී.ජී.පී.එස්.පී.එස්. ප්‍රේමසිරි (164336)
05. එන්.එච්.එස්.පී කරුණාරත්න (164209)
06. එම්.පී.එස් මධුශංක (164259)
07. ඩී.එච්.එම්.එච්.එම්. නන්දසේන (164283)
08. කේ.ජ්.ජ්.ඩබ්. චන්ද්‍රසිරි (154036)
09. ජ්.කේ වීරසිංහ (154430)
10. එම්.පී.එස්.ජේ. දන්තනාරායන (154043)
12. එම්.එම්.පී. මල්ලවාරච්චි (154235)
13. එස්.ඩබ්.එස්.ටී. මධුරංග (144171)

පසුව පැවැත්වූ පරීක්ෂණයෙන් අනතුරුව එහි ප්‍රතිඵලයක් ලෙස අදාල සිද්ධියෙන් වසර 03කට පසු පැමිණිලිකරුවන්ට දැඩි දඬුවම් පමුණුවා ඇති බවට තවදුරටත් පවසා ඇත.

තවද උක්ත විනය පරීක්ෂණය මෙහෙය වූ ආකාරය පිළිබඳවද ගැටළු සහගත තත්වයක් තිබෙන බවත්, විධිමත් විනය පරීක්ෂණය හරහා විශ්ව විද්‍යාල කවුන්සිලය දඬුවම් පැනවීමට ගත් තීරණයත්, පැමිණිලිකරුවන්ට එරෙහිව තිබෙන චෝදනා ඔප්පු කර ඇත්තේ කෙසේද යන්න සහ ඔවුන් වැරදිකරුවන් වී ඇති ආකාරය කෙසේද යන්න සැකයකින් තොරව ඔප්පු වුනේද යන්න හා දඬුවම් පැනවීමට ගත් තීරණය සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් විසින් කරන ලද බවට වගඋත්තරකරුවන් විසින් පවසන ලද වැරැද්ද කුමක්ද යන්න පිළිබඳව නිශ්චිතව හඳුනාගෙන නොමැති බවත්, උක්ත ශිෂ්‍යයන් විසින් සිදු කරන ලද විරෝධතාවයට සහභාගි වූ සිසුන් පිරිස අතර, පැමිණිලිකරුවන් සිටින බව එකදු පුද්ගලයෙකුවත් හඳුනාගැනීමට නොහැකි වූ අතර, චෝදනා පත්‍රයේ දක්වා ඇති කිසිදු වරදක් පැමිණිලිකරුවන් විසින් සිදු කළ බවට ඔප්පු වී නොමැති බවද සඳහන් කර ඇත.

තවද, වීඩියෝ දර්ශන වලද, පැමිණිලිකරුවන් කිසිවෙකු ප්‍රචණ්ඩකාරී ලෙස හැසුරුණු බවට නොපෙනෙන බවත්, විධිමත් පරීක්ෂණයේදී චෝදනාවට ලක් වූ සිසුන් කිහිපදෙනෙකුගේ සාක්ෂි මෙහෙයවා නොගත් අතර, එමගින් ස්වභාවික යුක්තිය උල්ලංඝනය වී ඇති බවත්, වගඋත්තරකාර උපකුලපතිවරයා විසින් දඬුවම පනවා ඇත්තේ, සාක්ෂි මත නොව සාමන්‍ය කරුණු පදනම් වී බවද

ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ නිලධාරියා පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බවද දක්වා ඇත.

එබැවින්, පැමිණිලිකරුවන්ගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වූ 12(1), 12(2), 13(3), 14(1) යන මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.

තවද මෙම පැමිණිලිකරුවන්ගේ විශ්ව විද්‍යාල ශිෂ්‍යභාවය වසර 04කට අත්හිටුවමින් විශ්ව විද්‍යාලයේ උපකුලපතිගේ ප්‍රධානත්වයෙන් යුත් විධිමත් පරීක්ෂණය මගින් නිර්දේශ කර කවුන්සිලය මගින් ගන්නා වූ තිරණය අවලංගු කරන ලෙසට සහන වශයෙන් අයැද සිටියි.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැලකිරීම :-**

ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා විසින් සිය 2018.06.01 දිනැති ලිපිය මගින් 2018.05.24 දින පෙ.ව.8.45ට පමණ තම පීඨයේදී ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍ය පිරිසකුගේ ප්‍රචණ්ඩකාරි හැසිරීමක් සිදු වූ බවට උපකුලපතිවරයාට දන්වා තිබුණු බවත්, ඒ අනුව උපකුලපතිවරයා 2018.06.05 දින මේ සම්බන්ධ මූලික පරීක්ෂණයක් සිදු කිරීමට නිලධාරින් 03 දෙනෙකු පත් කළ බවත් දක්වා ඇත.

තවද, 2018.06.20 දින මූලික විමර්ශන වාර්තාව උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, සිසුන් 13දෙනෙකුට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත්, ඉන් අනතුරුව 2018.08.08 දිනැති චෝදනා පත්‍රය ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍යයන් 13 දෙනෙකු වෙත ඉදිරිපත් කළ බවත්, එම සිසුන් 13 දෙනා විසින් 2018.08.17 දිනැති ලිපිය මගින් චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනා ප්‍රතික්ෂේප කර ඇති බවත්, 2021.03.23 වන දින පැමිණිලිකාර සිසුන්ට එරෙහිව සිදු කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව පරීක්ෂණ නිලධාරියා විසින් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති බවත් දක්වා ඇත. එම විධිමත් විනය පරීක්ෂණ වාර්තාව විශ්ව විද්‍යාල විනය මණ්ඩලය වෙත යොමු කර ඇති අතර, 2021.04.21 දින එහි නිර්දේශය උපකුලපතිවරයා වෙත යොමු කර ඇති බවත් පසුව 2021.07.01 දින පැවැති 218 වන පාලක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය විනය සම්බන්ධ 2018 අංක 01 දරණ අනු නීති මාලාවට අනුව විශ්ව විද්‍යාලයේ ප්‍ර.කො.ස / අංක 946 දරණ චක්‍රලේඛයේ පදනම් II උපලේඛනයේ x, xii, xiii, xiv (a), xiv(b), xxv, xxxii හා චෝදනා වලට පැමිණිලිකාර පාර්ශවය වැරදිකරුවන් බවත්, ඒ අනුව, II උපලේඛනයේ x, xii, xiii, xiv (a), xiv (b), xxv, xxxii යන දඬුවම් අදාල වැරදිකරුවන්ට හිමිවන බවත්, 2021.08.09 දිනැති ලිපිය මගින් උපකුලපතිවරයා විසින් චූදිත

ශිෂ්‍යයන්ට විරුද්ධව දෙන ලද දඬුවම් ලිඛිතව ඔවුන් වෙත දැනුම් දී ඇති බවත් තවදුරටත් සඳහන් කර ඇත.

අදාල චූදිත ශිෂ්‍යයන් 13 දෙනා විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, එම අභියාචනා සලකා බැලීමට 2021.09. 24 දින පැවැති 220 වන පාලක සභාව විසින් අභියාචනා කමිටුවක් පත් කර එම කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාවද 2021.10.22 වනදින පැවති 221 වන පාලක සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව මුල් අවස්ථාවේ ලබාදුන් අවුරුදු 04ක දඬුවම ලිහිල් කර අවුරුදු 02 ක විශ්ව විද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීමක් ලබා දී දෙන ලද බව දක්වා ඇත.

ඉන් පසුවද ශිෂ්‍යයන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති නමුත්, ඒවා සලකා බැලීමේ හැකියාවක් නොමැති බවට පාලක සභාව විසින් තීරණය කර ඇති බව තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත.

**නිරීක්ෂණ =:**

පැමිණිලිකරුවන් සහ වගඋත්තරකරුවන් විසින් පරීක්ෂණ අවස්ථාවේදී සිදු කරන ලද වාචික කරුණු සහ ඉන් පසුව ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනය සැලකිල්ලට ගැනීමේදි පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත.

01. 2018.05.24 දින උදෑසන 8.45ට පමණ ව්‍යවහාරික හා විද්‍යා පීඨයේ යම් කලහකාරී තත්ත්වයක් සිදු වී ඇති බවට නිරීක්ෂණය වේ.

02. එහිදී එම සිදුවීමට සිසුන් 50 දෙනෙකු පමණ සහභාගී වී ඇති බවට විශ්ව විද්‍යාලය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඇසින් දුටු සාක්ෂි වලින් පෙනීයයි.

03. නමුත් දඬුවමට ලක් වී ඇති සිසුන් 13 දෙනා නිශ්චිතවම හඳුනාගත් බවට පරීක්ෂණය තුල කිසිදු අවස්ථාවක සඳහන් නොවන බවට නිරීක්ෂණය වේ.

04. එක් අවස්ථාවකදී, විශ්ව විද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, ආචාර්ය වයි.පී.ටී.එන්. විදානගම මහතා විසින් සත්‍යතාව සහතික කරන ලද වීඩියෝ පටය සහ පින්තූර යොදා ගනිමින් සාක්ෂි මෙහෙයවීමට විමර්ශන නිලධාරියා අවසර දීමෙන් පසු මහාචාර්ය විදානපතිරණ, විමර්ශන සඳහා සහභාගී වී සිටි සිසුන් 03දෙනෙකු වන එම්.එම්.පී. මල්ලවආරච්චි(154235), ඩී.එම්.එම්.එච්.එම්. නන්දසේන (164283), ඒ.කේ.වීරසිංහ (154330) යන සිසුන් හඳුනාගෙන ඇති නමුත් මෙම විධිමත් පරීක්ෂණය පුරාවටම අන් ශිෂ්‍යයන් පිළිබඳ හඳුනාගැනීමක් කිසිදු තැනක සටහන් නොවන බවට ද නිරීක්ෂණය වේ.

05. විධිමත් පරීක්ෂණය තුළදී, සමස්ත සිදුවීමටම අදාලව වගඋත්තරකාර පාර්ශවය විසින් පොදුවේ සාක්ෂි ලබා දීමක් සිදු කරනවා මිස දඩුවමට පාත්‍ර වූ ශිෂ්‍යයන් 13 දෙනා පිළිබඳව නිශ්චිතවම සාක්ෂි ලබාදීමක් නිරීක්ෂණය නොවේ.

06. දඩුවමට පාත්‍ර වූ චූදිත ශිෂ්‍යයින් 13 ත් දෙනාගෙන් තෙවන හා සිව්වන වසර සිසුන්ගේ දඩුවම් කාලය නිම වී, ඔවුන් මේ වන විට උපාධිය ලබාගෙන ඇති අතර, දෙවන වසර සිසුන්ගේ පමණක් එක් උපාධි උත්සවයක් මගහැරී ඇති අතර, ඉදිරියේදී පැවැත්වීමට නියමිත උපාධි උත්සවයද, (2023 ඔක්තෝම්බර් මස) මෙම පැමිණිලිකාර ශිෂ්‍යයන්ට ලබා දී ඇති දඩුවම හමුවේ මගහැරී යාමට බොහෝ ඉඩකඩ ඇති බවද පෙනී යයි.

07. මෙහිදී, විශේෂයෙන්ම දෙවන වසර සිසුන්ට, ඔවුන් පළමු වසරේ සිට දෙවන වසරට ඇතුළු වූ අවධියේ මෙම අවාසනාවන්ත සිදුවීමට මුහුණ දීමට සිදු වී ඇති අතර, එහිදී, විශ්ව විද්‍යාලය තුළ පවතින උප සංස්කෘතින්ට අනුකූලව ඔවුන්ට ඉහළින් සිටි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායම් 02ක නියමයන්ට සහ විධානයන්ට අනුකූලව මෙම ශිෂ්‍ය විරෝධතාවයට සහභාගි වීම සිදුව ඇති අතර, එය ඔවුන්ගේ පූර්ණ කැමැත්ත නොමැතිව සහභාගි වූවක් බව 2023-04-11 දිනැති ලිපියෙන් පැමිණිලිකරුවන් විසින් පවසා ඇත.

නිගමනය =:

මෙහිදී මෙම කාරණය උපකුලපතිතුමා විසින් කවුන්සිලයට ඉදිරිපත් කර දඩුවම් ලබාදීමෙන් පසු නැවත පැමිණිලි පාර්ශවයේ අභියාචනා සලකා බලා අවු 04ක දඩුවම අවුරුදු 02කට ලිහිල් කර ඇත. නමුත් පැමිණිලිකාර ශිෂ්‍යයන්ට එරෙහිව සිදු කරන්නා වූ විධිමත් පරීක්ෂණය දෙස බැලීමේදී උක්ත සිසුන් 13 දෙනා පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය ගන්නා වූ තීරණය සහ දඩුවම දැඩි දඩුවමක් බවට නිරීක්ෂණය වන අතර, නීතියේ මූලධර්මය අනුව ඔවුනට ඇති චෝදනා ඔප්පු වූයේද යන්න වගඋත්තරකරුවන් තහවුරු කර නොමැති බව නිරීක්ෂණය වේ. තවද මෙම වගඋත්තරකාර පාර්ශවය විසින් පෙත්මකාර ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යභාවය අවුරුදු 02ට හෝ අත්හිටුවීමට පෙර මෙම චෝදනා ඔප්පු වී තිබේද යන්න සලකා බැලීමකින් තොරව සිදුව ඇති බැවින් පැමිණිලිකරුවන්ගේ නීතියේ රැකවරණය සහ සර්ව සාධාරණත්වයේ අයිතිය උල්ලංඝනය කරමින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ඒ අනුව, මෙම ලබා දී ඇති දඩුවම තුළ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ලෙස ඔවුන්ගේ ශාස්ත්‍රීය ජීවිතය (Academic Life) සහ පෞද්ගලික ජීවිතය තුළ විශාල පසුබෑමකට ලක්වන බවත්,

ඒ තුලින් ඔවුන්ගේ සහ දෙමාපියන්ගේ අනාගත බලාපොරොත්තුන් නිෂ්ඵල වීමට හේතුවිය හැකි බවත් නිරික්ෂණය වේ. මෙම පරීක්ෂණ ක්‍රියාවලිය තුළ මෙම සිසුන් 50 දෙනාගෙන් 13 දෙනෙකු හට පමණක් දඩුවම ලබා දෙන්නේ කුමන පදනමක් යටතේද කියා කිසිදු තැනක පැහැදිලිව සදහන් නොවන නිසාත්, මෙම දඩුවම තුළ දෙවන වසර සිසුන් වඩාත් අගතියට පත්වන නිසාත් ලබා දී ඇති අවුරුදු 02ක දඩුවම ලිහිල් කිරීමට කටයුතු කරන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 07 . 10 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- ගරු අමාත්‍යතුමා,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
වෝඩ් පෙදෙස, කොළඹ 07.

B/